# සිතන්නට යමක් !

එදිනෙදා එකතු වන
"කුණු" ලෙසින් අප සිතන
සැමවෙතින් ජනිත වන
අපද්‍රව්‍ය ගැන සිතමු !

දරන්නට බැරි ලෙසට
අවිධිමත් අයුරකට
අනුන් ගැන නොම සිතා
තැනින් තැන දමන "කුණු"
අපගේම සුව සෙතට – දරන්නට බැරි ලෙසට
වින කරයි ඉදිරියට – පිළියමක් නැති ලෙසට

එවන් මහ විපතකට
අප සැවොම බිලි වෙමුද?
විනාශය දැක දැකම
අපට කළ හැකි යමක් – නොමැති යයි සිත සිතා
මනස ගොළු කර තබා
නෙතු පියන් දල්වමින්
විපිළිසර වූ සිතින්
විනාශයටම යමුද..............?

අප සැවොම එක්වෙලා
අපි අපිම හැකි ලෙසින්
අප වෙතින් ජනිත වන
"කුණු" ලෙසින් අප සිතන
අපද්‍රව්‍ය හැකි තරම් වැඩිවීම අඩුකරමු !
හැකි තරම් හැකි ලෙසින්
නැවත භාවිත කරමු !

ඉතිරි වන අපද්‍රව්‍ය
අප නිවස ඇතුලතම
වෙන් වෙන්ව එකතු කොට
නියම කළ දිනයකට
නිසිකලට, පිළිවෙලට
එකතු කරගනු පිණිස
නිවෙස අසලින් තබමු !

පිළිවෙලට තබන ලද
එම කසල එකතු කොට
නිසි පරිදි හැසුරුමට
දැඩිව ඉල්ලා සිටිමු !!
හැකි තරම් සහය වෙමු !!

පද්මිණී බටුවිටගේ